# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.05.11 පැය 1430 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/247 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**කුලී පදනම මත ලබාගන්නා ලැගුම්හල්, වාණිජ ගොඩනැඟිලි, මහල් නිවාස, නිවාස හා වෙනත් ගොඩනැඟිලි තුල සිදු කරනු ලබන වංචනික ක්‍රියා හා අපරාධ වළක්වාගැනීම සඳහා හිමිකරුවන් දැනුවත් භාවයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය.**

ලැගුම්හල්, වාණිජ ගොඩනැඟිලි, මහල් නිවාස, නිවාස හා වෙනත් ගොඩනැඟිලි කුලී හෝ බදු පදනම මත කෙටි කාලීනව හෝ දීර්ඝ කාලීනව ලබාගන්නා පුද්ගලයින් හෝ කණ්ඩායම් විසින් එම පරිශ්‍රයන් භාවිතා කරමින් විවිධ වංචනික ක්‍රියාවන් සිදු කරන බවට නිරීක්ෂණය වී ඇති බැවින් මෙවැනි ස්ථාන කුලී පදනම මත ලබාදීමේදී එම අයිතිකරුවන් විසින් සැළකිලිමත්ව කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

මෙම නිවාස හා ගොඩනැගිලි අයිතිකරුවන් කිසිසේත් අපේක්ෂා නොකරන ආකාරයට බදු හෝ කුලී පදනම මත එම පරිශ්‍රයන් ලබාගන්නා පුද්ගලයන් විසින් වංචනික ක්‍රියා හා අපරාධ සිදු කිරීම සඳහා මෙම පරිශ්‍රයන් භාවිතා කිරීම සිදුවන අවස්ථාවන් විශාල වශයෙන් වාර්තා වී ඇත. මේ හේතුවෙන් හිමිකරුවන්ට විවිධ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවීම මෙන්ම අපරාධමය චෝදනාවලට ලක්වීමද සිදුවී ඇති බවට නිරීක්ෂණය වේ.

පසුගිය වර්ෂය හා 2026 වර්ෂයේ මේ දක්වා කාල සීමාවේදී විශේෂයෙන්ම ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් විදේශීය ජාතිකයින් දිවයිනේ විවිධ පළාත් වල නිවාස සංකීර්ණ, හෝටල් හා ලැගුම්හල් ආදී ස්ථාන වල රැඳී සිටිමින් ඉතාමත් රහසිගතව අන්තර්ජාලය ඔස්සේ මූල්‍ය වංචා සිදු කරමින් සිටියදී ඊට අදාල පරිගනක ඇතුළු තාක්ෂණික උපකරණද සමඟ අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාත්මකව වැඩි වීමක් නිරීක්ෂණය වී ඇත. එසේම එවැනි අපරාධකරුවන්ට එරෙහිව ආගමන විගමන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පොලිසිය දැනටමත් නීතිය ක්‍රියාත්මක කර ඇත.

මෙවැනි තත්ත්වයන්ගෙන් ආරක්ෂාවීම සඳහා පහත පරිදි පුරවැසියන් දැනුවත්වීම ඉතා වැදගත් වේ.

- **සෑම පුරවැසියෙකුම පොලිස් ආඥා පනතේ 76 වැනි වගන්තිය අනුව යම් නිවසක පදිංචි සියලුම පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගැනීමේ බලය පොලිසියට ඇති බවට දැනුවත් වීම වැදගත් වේ.**
- **ඒ අනුව, ගෘහමූලිකයා විසින් පවුලේ සාමාජිකයන්, සේවකයන් හා තාවකාලික පදිංචිකරුවන් පිළිබඳ තොරතුරු අදාළ පොලිස් ස්ථානය වෙත ලබාදිය යුතුය.**

- **පදිංචිකරුවන්ගේ වෙනස් වීමක් ( සාමාජිකයින් අළුතින් පැමිණීම හෝ පිටව යාම ) අළුතින් සිදුවන සෑම අවස්ථාවකදීම ඒ සම්බන්ධව අදාල පොලිස් ස්ථානය වෙත දැනුම් දීමට ගෘහමූලිකයා හෝ නිවාස හිමිකරුවා බැඳී සිටියි.**
- **ඉහත වගත්ති ප්‍රකාරව එසේ නොකර හැරීම දඩුවම් ලැබිය හැකි වරදක් වනු ඇත.**

එසේම මෙවැනි ස්ථාන හෝ පුද්ගලයින් සම්බන්ධව ලැබෙන සියළු තොරතුරු සෑම පොලිස් වසමකම පිහිටුවා ඇති මහජන ආරක්ෂක කමිටු සාමාජිකයින් හරහා පොලිසිය වෙත ඉතා කඩිනමින් දැනුම් දීමේ හැකියාවද පවතී.

කුලී හෝ බදු පදනම මත තම නිවාස හෝ ගොඩනැගිලි ලබාදීමේදී සෑම විටම ලබාගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය හා අවශ්‍යතාවය සම්බන්ධයෙන් අවධානයෙන් හා සැලකිලිමත්භාවයෙන් කටයුතු කිරීම තුළින් සිදුවිය හැකි වංචනික ක්‍රියා හා අපරාධ අවම කර ගැනීමට මෙන්ම නිවාස හිමියන් ගැටලුකාරී තත්ත්වයන්ට ලක්වීමෙන් වළක්වා ගත හැකිවනු ඇත.

ශ්‍රී ලංකා පොලිසිය සෑම විටම මෙවැනි අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා දිගින් දිගටම මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර නේවාසික ස්ථානවල රැඳී සිටිමින් දේශීය හා විදේශීය ජාවාරම්කරුවන්, අපරාධකරුවන් සම්බන්ධයෙන් හෝ ඔවුන් විසින් සිදු කරනු ලබන නීති විරෝධී හෝ සමාජ විරෝධී කටයුතු පිළිබඳ තොරතුරු ලද වහාම 119, 118 දුරකථන අංක හෝ ළඟම පිහිටි පොලිස් ස්ථානය දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් ශ්‍රී ලංකා පොලිසිය ඉල්ලා සිටිනු ලැබේ.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.